# බටහිර නූතනත්වයේ රඟ

අප ජීවත්වන්නේ නූනනත්ව ලෝකයක ය. පෘතුගීසීන් පැමිණි දින සිට ලංකාවේ අප මත නූතන ලෝකය පැටවීමට බටහිරයන් ක්‍රියාකර ඇත. පසුගිය අවුරුදු විසිහතක පමණ කාලයෙහි ඊනියා විවෘත ආර්ථිකය හඳුන්වා දීම යනුවෙන් කෙරී ඇත්තේ ඒ ක්‍රියාකාරිත්වය වේගවත් කිරීමය. එහෙත් බටහිරයන් හෝ ඔවුන්ගේ මෙරට නියෝජිතයන් හෝ මෙහිදී පූර්ණ සාර්ථකත්වයක් ලබා නැත. අප නොදියුණු යැයි කියැවෙන්නේ ඒ නූතනත්වකරණ ව්‍යාපෘතිය සාර්ථක වී නොමැති බැවින්ය. ආසියාවේ අනෙක් බොහෝ රටවල් නූතනත්ව ව්‍යාපෘතිය වැළඳ ගැනීමට උත්සාහ කරද්දී අපට ජාතියක් ලෙස තවමත් ඒ පූර්ණත්වයකින් කිරීමට නොහැකි වී ඇත. එහිදී නොහැකි වී ඇත කීමට වඩා අප ඒ සඳහා දැඩි උත්සාහයක් ගෙන නැතැයි කීම නිවැරදි යැයි සිතමි. ඉන් අදහස් කරන්නේ කිසිවකු ඒ සඳහා උත්සාහයක් ගෙන නොමැති බව නොවෙයි. බටහිරකරණය වූවන්, සංකරයන්, තුප්පහියන්, කුල්ටන් (සංස්කෘතියක් ඇත යන ජර්මන් කුල්ටූර් යන විවේචනයෙන් බිඳී ඇත) මුල් සිඳගත්තවුන්, ජාත්‍යන්තරව සිතන්නවුන්, ළිං මැඩියන් නොවූවන්, උගතුන්, බුද්ධිමතුන් ආදීන් ලෙස සමාජය විසින් හෝ තමන් විසින් හෝ හැඳින්වෙන්නේ එසේ නූතනත්වය වැළඳ ගැනීමට උත්සාහ දරා ඇති අයය. එහෙත් සමස්තයක් ලෙස ගත් කල මේ ප්‍රවණතාවට විරුද්ධව යන සම්ප්‍රදායක් ද මෙරට ඇත. ජපන් ෆයිව් එස් හා වෙනත් ජාත්‍යන්තර ක්‍රම හඳුන්වා දුන්න ද සමාජයට ඉන් විශාල බලපෑමක් නොවෙයි.

කෙසේ වෙතත් අද අප රටේ සිදුවන බොහෝ කරුණු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට නූතනත්වය පිළිබඳ දැන සිටිය යුතුය. සමස්තයක් ලෙස අප සමාජයේ ඇති අසහනයට (ඇතමුන් නූතනත්ව වචනයක පරිවර්තනයක් වූ ආතතිය යන්න යොදා ගනු දැකිය හැකිය. එහෙත් මෙරට ඇත්තේ අසහනයක් යැයි සිතමි. ඊනියා ආතතියකට වඩා මෙරට ඇත්තේ තෙරපුමක් බව උසස් පෙළ සංයුක්ත ගණිතය හදාරන සිසුවකු කියනු ඇත.) හේතුව වී ඇත්තේ නූතනත්වයට පැනීමට, ඒ වැළඳ ගැනීමට ඇති අවශ්‍යතාව හා එයට විරුද්ධවීම අතර වූ ප්‍රතිවිරෝධය බව මගේ විශ්වාසය වෙයි. නූතනත්වය යනු අප මත බලයෙන් පැටවීමට ක්‍රියාකෙරෙන්නකි. ඇතැමුන් යොදා ගන්නා තවත් බටහිර වචනයක පරිවර්තනයක් වූ උත්තරාරෝපණය යන්නේ බලයෙන් පැටවීම යන අර්ථය ගෙන නොදෙයි. උන්තරාරෝපණය යන වචනය නිර්මාණය කළෝ බටහිරයෝය. ඔවුන් ගෙන යන යටත්විජිතවාදී වැඩපිළිවෙළකට, ව්‍යාපෘතියකට, සම්භාවනීයත්වයක් ආරෝපණය කිරීමක් ඒ වචනය භාවිතයෙන් සිදුවෙයි. බටහිරයන්ගේ වචන පරිවර්තනය කර යොදා ගැනීමේදී අප පරෙස්සම් විය යුතුය. නූතනත්වය අප මත බලයෙන් පැටවීමට කටයුතු කළ බැවින් හා කටයුතු කෙරෙන බැවින් සිංහලයෝ සමස්තයක් ලෙස එයට විරුද්ධ වෙති. නූතනත්වය අපේ සංස්කෘතියට උරා ගැනීමට, අවශෝෂණය කර ගැනීමට අපට ඉඩ දුනි නම් අප වෙනත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට බෙහෙවින් ඉඩ තිබිණි. එහෙත් බටහිරයෝ එසේ නොකළහ. ඔවුන්ට අවශ්‍ය වූයේ නූතනත්වය අප මත බලයෙන් පැටවීමටය.

මෙහිදී පසුගිය වසර දහයක පහළොවක පමණ කාලයක් තිස්සේ මෙරටට බලයෙන් පැටවීමට උත්සාහ කරන ඊනියා පශ්චාත්නූතනත්වය ගැන ද වචනයක් දෙකක් කිව යුතුය. අංක එකේ පුස්සන් වූ මෙරට පශ්චාත්නූතනවාදීන්ට ඇත්තේ දැඩි හීනමානයකි. තම තමන් පොරවල් වීම සඳහා බටහිර කසිකබල් විශ්ලේෂකයන්ගේ වලංගු බවක් නැති මත මෙරට ප්‍රචාරය කිරීමේ කොන්ත්‍රාත්තුව මොවුන් භාරගෙන ඇත. පශ්චාත්නූතනත්වය යන්න බටහිර එතරම් දක්ෂ නැති ඊනියා චින්තකයන් යැයි කියන පිරිසක් විසින් හඳුන්වා දෙනු ලැබ ඇති කසිකබල් සංකල්පයක් පමණකි. ලංකාවේ නොව ලෝකයේ කොහේවත් පශ්චාත්නූතනත්වයක් නැත. ඒ බව පෙන්වීම මහා

කජ්ජක් නොවෙයි. ඒ සඳහා කළ යුත්තේ ලියෝතාද් නම් තුන්වැනි පංතියේ චින්තකයකු විසින් ලියනු ලැබ ඇති පශ්චාත්නූතන අවශ්‍යතාව (පොස්ට්මොඩන් කන්ඩිෂන්) නම් පොතෙහි සඳහන් කෙරී ඇති අවශ්‍යතා ලෝකයේ කොහේවත් සම්පූර්ණ වී නොමැති බව පෙන්වීම පමණ ය. ඉඩ ලැබෙන පරිදි අපි ඒ කරමු. ඊනියා පශ්චාත්මාක්ස්වාදය ටොලමිගේ කාලයේ ග්‍රීක සම්ප්‍රදායෙහි බිහිවූවක් පමණ ය. වස්තුවක චලිතය වෘත්තාකාර පථවල සිදුවන්නේ යැයි පැරැණි ග්‍රීකයෝ විශ්වාස කළහ. එය එසේ නොවන බව ආකාශ වස්තු සම්බන්ධ නිරීක්ෂණවල දී

© Prof. Nalin De Silva

පෙනී ගිය විට ටොලමි වෘත්තාකාර පද්ධති රැක ගැනීම සඳහා වෘත්තයක් වටේ කුඩා වෘත්තවල චලිතය හඳුන්වා දුන්නේය. එයට අපි චක්‍ර (එපිසයිකල්ස්) යැයි කියනු ලැබෙයි. අද මුෆ්, ලැක්ලාව් වැනි ඊනියා පශ්චාත්මාක්ස්වාදීන් කරන්නේ අපිචක්‍ර යොදමින් මාක්ස්වාදී ප්‍රවාද රැක ගැනීමට උත්සාහ කිරීමය. එය අතීසාරයට අමුඩ ගැසීම වැනි වැඩක් බව බටහිරයන් නොදන්නවාට අමුඩය ගැන දැනීමක් ඇති මෙරට අනුකාරක පශ්චාත්මාක්ස්වාදීන් දැන ගත යුතුය. එහෙත් ඔවුන් තමන්ට අමුඩය ගැන දැනීමක් නැතැයි කීමට වෙර දරන බැවින් ඒ දැනුම යොදා ගැනීමට නොහැකිය. අනෙක් පැත්තෙන් තොරතෝංචියක් නැතිව බටහිර විද්‍යාව ගැන කතා කළ ද මොවුන්ට අපිචක්‍ර ගැන හෝ දැනුමක් නැත. අල්තුසර යනු මේ අමුඩ ගැසීමේ ප්‍රවණතාවයෙහි මූලිකයකු යැයි සිතමි. පංතිය යන සංකල්පය බේරා ගැනීම සඳහා ඔහු ඊනියා ඕවර්ඩිටර්මින්ඩ් යන සංකල්පය ඉදිරිපත් කළේය. ඒ සංකල්පය යනු මාක්ස්වාදී අතීසාරයට අමුඩ ගැසීමක් වෙයි. මේ සංකල්පය අද සිංහලට පරිවර්තනය වී ඇත්තේ අධිනිශ්චය යනුවෙන්ය. ඩිටර්මින් යන වචනයෙහි ඇත්තේ නිර්ණය යන තේරුම මිස ඊනියා නිශ්චයක් නොවේ. පුස්සන්ගේ පරිවර්තනය නිසා සිදු වී ඇත්තේ අමුඩයෙහි හිලක් නිර්මාණය වීමය. අද මෙරට ඇතැම් පුස්සෝ කලාකරුවන් අධිනිශ්චයවීම පිළිබඳව මැත දොඩවති. ඔවුන් අධිනිශ්චය යන වචනය යොදා ගන්නේ අධිඅගයක්, අධි වටිනාකමක් ආදී වශයෙන් ලබා ඇති, දත ඇති යන අර්ථයක් දැනවීමටය. එයට ඕවර්ඩිටර්මින්ඩ් යන සංකල්පය සමග කිසිම සම්බන්ධයක් නැත. එහෙත් මෙරට සිටින පුස්සන්ට ඒ කිසිවක් නොතේරෙයි.

විදුසර ලිපි පෙළට පරිපූරකයක් වූ මේ ලිපි පෙළ අතරින් පතර ලියැවෙනු ඇත. එදිනෙදා දේශපාලනය සඳහා වැඩි ඉඩක් දෙන මේ තීරුවෙහි ඉඩ ලැබෙන පරිදි නූතනත්වය ගැන කතා කෙරෙනු ඇත. නූතනත්වය යනු කුමක් දැයි අපේ පැත්තෙන් බලා තේරුම් නොගෙන, මෙරට දේශපාලනය තේරුම් ගත නොහැකිය. උදාහරණයක් ලෙස පසුගිය සතියේ අප සඳහන් කළ නෝර්වේ රාජ්‍යයේ මැදිහත්වීම තේරුම් ගන්නේ කෙසේද? නෝර්වේ රාජ්‍යය වෙනත් රටවල ද ඊනියා සාමකතා පිළිබඳ පහසුකම් සපයන්නකු ව සිට ඒ රටවල් බෙදීමට කටයුතු කර ඇති ආකාරය පිළිබඳ විස්තර සඳහන් කිරීමෙන් හෝ මෙරට නෝර්වේ රාජ්‍යය අවස්ථා කිහිපයකදී ම ක්‍රියාකර ඇති අන්දම කීමෙන් හෝ නෝර්වේ පිළිබඳ අපට මනා වැටහීමක් ලබා ගැනීමට හැකි වෙයිද? විස්තර වැදගත් බව සැබෑය. එහෙත් විස්තරවලින් පමණක් අපට එතරම් දෙයක් දැන ගත නොහැකිය. විස්තර කෙතරම් ප්‍රමාණයක් තිබුණ ද යම් සංකල්පයක්, ප්‍රවාදයක් නොමැතිව ඒ විස්තරවලින් කියැවෙන්නේ කුමක් දැයි දැන ගැනීමට නොහැකිය. අප රටේ බොහෝ දෙනා කැමති විස්තර දැන ගැනීමට මිස සංකල්ප, ප්‍රවාද, ව්‍යුහ ආදිය ගැන දැන ගැනීමට නොවෙයි. මෙරට උගතුන් ලෙස බුද්ධිමතුන් ලෙස පිළිගැනීමක් ලැබෙනුයේ විස්තර දන්නා අයටය. කෙසේ වෙතත් එවැනි කැමැත්තක් ඇති අය වුව ද කරන්නේ බටහිරින් අප මත පටවනු ලැබූ සංකල්ප ආදිය යොදා ගැනීමය. එමග ගැනීමෙන් අපි තව තවත් අතරමං වන්නෙමු. නෝර්වේ යනු බටහිර ලූතර්වාදී (ක්‍රිස්තියානි) රටක් බවත් අද එය ක්‍රිස්තියානි නූතනත්වය සහ ඒ හා සම්බන්ධ යටත්විජිතවාදය වෙනුවෙන් විශාල කාර්යභාරයක් කරන රටක් බවත් ඒ පිටුපස ඇමරිකන් එක්සත් ජනපද මෙන්ම බ්‍රිතානිය ද සිටින බවත් වටහා ගැනීමකින් තොරව, භූ ආර්ථික කරුණු වූ ලංකාවේ උතුරු හා නැගෙනහිර මුහුදු තීරයෙහි ඇතැයි කියන තෙල් නිධි ලබා ගැනීම හෝ නෝර්වේහි ධීවර කර්මාන්තයෙහි ලංකාවෙන් ගිය දෙමළ තරුණයන් නිරතවීම ආදිය මත පමණක් පිහිටා නෝර්වේ මැදිහත්වීම තේරුම් ගැනීමට යෑම හොරාගෙ අම්මාගෙන් පේන ඇසීමකි. එවැනි ආර්ථික කරුණු මත පමණක් පදනම් වී නෝර්වේ තේරුම් ගැනීමට අප යොමු කරන්නේ බටහිරයන් හා ඔවුන්ගේ නියෝජිතයන් බව අමතක නොකළ යුතුය. මේ නියෝජිතයන් අතර හිටපු පූජකයෝ ද වෙති.

අප බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ගැන ප්‍රවාද නිර්මාණය කරන්නේ ඒ ඔස්සේ මේ ලෝකය ගැන වැටහීමක් ලබා ගැනීමටය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ගැන අප ප්‍රවාද නිර්මාණය කරන්නේ එමගින් පොදුවේ ලෝකය දෙස බැලීමටය. එනම් අපේ ලෝකයක් නිර්මාණයකර ගැනීමටය. වත්මන් ලෝකය (එනම් ඒ පිළිබඳ දැනුම) අප විසින් නිර්මාණය කෙරුණක් නොවීමේ ප්‍රතිඵලය වී ඇත්තේ අප බටහිරයන්ට අවශ්‍ය ආකාරයට ලෝකය දැකීමය. ලිබරල්වාදය, මාක්ස්වාදය, පශ්චාත්මාක්ස්වාදය ආදිය පමණක් නොව නූතනත්වය පිළිබඳ බටහිර නිර්මාණය කෙරෙන දැනුම ද බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය, අඩුම තරමින් එහි සංරචකයක් වූ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදය පවත්වා ගෙන යෑම සඳහා ම වෙයි. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදය හා ධනවාදය යනු මාක්ස්වාදී විග්‍රහයන්ට අනුව හෝ බිහි වූ දෑ නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ප්‍රතිඵල බව අපට පෙන්වා දිය හැකිය. වෙනත් වචනවලින් කියන්නේ නම් අපේ සංස්කෘතියට සාපේක්ෂව ලෝකය පෙනෙන්නේ, නිර්මාණය වන්නේ එලෙසින්ය. බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදීන්ට අවශ්‍ය ආකාරයට ලෝකය බැලීමට, නිර්මාණය කර

© Prof. Nalin De Silva

ගැනීමට, සංස්කරණය කිරීමට අවශ්‍ය පුද්ගලයෝ එසේ කරත්වා. මේ ඊනියා ජාත්‍යන්තරවාදීන් අපට පටු ජාතිවාදීන්, පටු ජාතිකවාදීන්, ලිං මැඩියන් ආදී වශයෙන් නිග්‍රහ කරන බව අපි දනිමු. ඔවුන් එසේ කරන්නේ ඔවුන්ගේ ස්වාමිවරුන් වූ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ බලධාරීන් වෙනුවෙන් බව ද අපි දනිමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva